# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1980 අංක 16 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ-තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවානියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 අප්‍රේල් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි　　　　නැපැල් ගාස්තුව : ශත 35 යි

**1980 අංක 16 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවානියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1980 මාර්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 56/79.

**ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවානියුක්ති භාරය පිහිටුවීම සඳහා සහ සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

තරුණ අධ්‍යාපනය, පුනරුත්ථාපනය සහ සේවා නියුක්තිය, "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—ශ්‍රී ලංකා" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයේ පරමාර්ථ කිහිපයක් වන හෙයින් ද:

එකී ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—ශ්‍රී ලංකා නම් සංගමය විසින් තරුණ අධ්‍යාපනය, පුනරුත්ථාපනය සහ සේවානියුක්තිය යන එකී පරමාර්ථ වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිණිස "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවානියුක්ති භාරය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සංස්ථාපිත මණ්ඩලයක් පිහිටුවීම අවශ්‍යතාවෝචිත යයි සලකනු ලබන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 16 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය පිහිටුවීම සහ සංස්ථාගත කිරීම.

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවානියුක්ති භාරය" යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවා තිබිය යුතු ය.

(2) භාරය, (1) වන උපවගන්තිය විසින් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

භාරයේ භාරකාර මණ්ඩලය.

3. (1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධාන පරිදි පිහිටුවනු ලබන භාරකාර මණ්ඩලයක් වෙත භාරය පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පැවරිය යුතු ය.

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරයේ භාරකාර මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) (මෙහි මින් මතු "දිස්ත්‍රික්කය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ—ශ්‍රී ලංකා නමැති සංගමයේ දිස්ත්‍රික් පාලකවරයා ; ඔහු මණ්ඩලයේ සභාපති විය යුතු ය;

(ආ) දිස්ත්‍රික්කයේ පෙරාතුව ම සිටි දිස්ත්‍රික් පාලකවරයා ;

(ඇ) දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ ලේකම්වරයා ;

(ඈ) දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ භාණ්ඩාගාරිකවරයා ;

(ඉ) දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයන් සිව් දෙනකු ; සහ

(ඊ) දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ නිර්දේශය මත, දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු, දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයන් සිව් දෙනකු.

භාරයේ පරමාර්ථ.

4. භාරය පිහිටුවනු ලබන පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

(අ) හැකි සෑම අවස්ථාවක දී ම, තරුණයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම ;

(ආ) ඌන වරප්‍රසාද ලත්, අබල දුබල හෝ අංගවිකල අසරණ තරුණයින්ට ස්වකීය මූලික හෝ ද්විතීයික අධ්‍යාපනය නිම කිරීමට හැකි වන පරිදි අවශ්‍ය ආධාර සැපයීම ;

(ඇ) ඌන වරප්‍රසාද ලත්, අබල දුබල හෝ අංගවිකල අසරණ තරුණයින්ට විශ්ව විද්‍යාලයක හෝ තාක්ෂණික ආයතනයක ස්වකීය තාක්ෂණික හෝ ශාස්ත්‍රීය අධ්‍යාපනය නිම කිරීමට හැකි වන පරිදි අවශ්‍ය ආධාර සැපයීම ;

(ඈ) සහජ අංග විකෘතිවීම්වලින්, අනතුරුවලින්, ඉතා වැදගත් ශරීරාංගවලට බලවත් හානි සිදු කෙරෙන රෝගවලින් පීඩාවට පත් සහ වෙනත් යම් බාධාවන්ගෙන් පෙළෙන තරුණයින් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය වශයෙන් හැකි සියලු ආධාර සැපයීම ;

(ඉ) දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය දුබලතාවන්ගෙන් පෙළෙන තරුණයින් පුනරුත්ථාපනය කිරීම පිණිස විශේෂ ආධාර සැපයීම ;

(ඊ) රටෙන් පිටත දී වෛද්‍ය ප්‍රතිකාර හෝ ශල්‍යකර්ම කළ යුතු ලෙඩ රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා ලෝකයේ වෙනත් රටවල්වල සිංහ සමාජ සමග සහයෝගීව හැකි ආධාර සැපයීම ;

(උ) තරුණයින් අතර සේවානියුක්තිය ඇති කිරීම සඳහා ආණ්ඩුවේ අනුයෝජිත ආයතනවලට හැකි සියලු ආධාර සැපයීම ;

(ඌ) අර්ථවත් සේවානියුක්තිය ලබා ගැනීමට තරුණයින්ට හැකි වන පරිදි තරුණයින්ට වෘත්තීය පුහුණු කිරීම සඳහා වෘත්තීය පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම ; සහ

(එ) ප්‍රයෝජනවත් ස්වයං සේවානියුක්තිවල නියැලීම සඳහා තරුණයින්ට අවශ්‍ය කළමනාකරණ උපදෙස් දීම.

**5.** මණ්ඩලයට භාරයේ නාමයෙන් පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :— භාරයේ බලතල.

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත් කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) භාරයේ පරමාර්ථ දියුණු කරලීම සඳහා ආධාර, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව දීම;

(ඈ) ස්වකීය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ නියුක්ත කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික දීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ වැසීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ලබා ගැනීම හෝ මුදල් ලබා ගැනීම;

(ඊ) භාරයට අයත් මුදල්, භාරයේ මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙනු ලැබූ යම් ආයෝජනවල, මණ්ඩලයේ අභිමතය ඇතිව ආයෝජනය කිරීම සහ මණ්ඩලයේ අනුමතය අනුව ඒ ආයෝජන ආපසු ලබා ගැනීම, නැවත ආයෝජනය කිරීම හා වෙනස් කිරීම සහ ඒ ආයෝජනවලින් උපචිත වන ආදායම ලබා ගැනීම;

(උ) භාරයට අයත් හෝ භාරය විසින් දරනු ලබන යම් ඉඩමක, යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක්, ඉදිකිරීම හෝ ඉදි කිරීමට සැලැස්වීම; සහ

(ඌ) භාරයේ පරමාර්ථ ඉටු කිරීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

**6.** (1) පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා, මහා සභා රැස්වීමක දී, ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මණ්ඩලය විසින් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, කලින් කල සාදනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය :— රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

(අ) මණ්ඩලයේ ධුර කාලය, පත් කිරීම් සඳහා සුදුසුකම් සහ පත් කිරීමේ ක්‍රමය, ධුරයකින් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම සහ අනියම් පුරප්පාඩු පිරවීම;

(ආ) භාරයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි ඇතුළුව, ඔවුන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ ඒ පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වා ගෙන යාම;

(ඉ) භාරයේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම, එහි මුදල් භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගෙන යාම සහ විගණනය කිරීම; සහ

(ඊ) සාමාන්‍ය වශයෙන්, භාරයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම.

(2) මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.

භාරයේ මුද්‍රාව.

7. භාරයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තකුගේ ආරක්ෂිත භාරයෙහි තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) මණ්ඩලයේ අනුඥාව ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

8. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන් ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නො වන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොයැවීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.